# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - II

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 3 යි

**සැලකිය යුතුයි**

- **මෙම ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් දෙකකි.**
- **I කොටස අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුයි.**

---

**I කොටස**

01) (අ)

i. සිතියමක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල 2)

ii. භූ ලක්ෂණ සිතියමක ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල 2)

iii. තේමා සිතියම්වල ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල 2)


iv. 1: 50 000 රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ල 2)

v. 1: 50 000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන පහත සඳහන් සංස්කෘතික ලක්ෂණ සම්මත වර්ණ හා සංකේත මගින් දක්වන්න. (ල 2)

a) රෝහල b) වී වගාව

c) සෙසු මාර්ග d) දිස්ත්‍රික්ක මායිම


(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




අංක 01 සිට 05 තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියේ දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| 1) | මරියානා ආගාධය | A, B, C | |
| 2) | නවසීලන්ත දූපත් | A, E, F | |
| 3) | මකර නිවර්තනය | G, H, J | |
| 4) | සැක්‍රමැන්ටෝ නිම්නය | K, L, M | |
| 5) | නයිල් ගංගාව මුහුදට වැටෙන ස්ථානය | P, Q, R | |

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




අංක 01 සිට 05 තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියේ ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| 1) | සුළු පොල් ත්‍රිකෝණයට අයත් මිද්දෙණිය | A, B, C | |
| 2) | සංගමන්කන්ද තුඩුව | D, E, F | |
| 3) | මිරිස්ස ධීවර වරාය | G, H, J | |
| 4) | අඹේවෙල කිරිගම පර්යේෂණ මධ්‍යස්ථානය | K, L, M | |
| 5) | කුරුණෑගල දිස්ත්‍රික්කය | P, Q, R | |

## I කොටස

02)

i. ජෛව ගෝලය යන්න හඳුන්වන්න. (ල 2)

ii. ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වයට බලපාන සාධක දෙක නිදසුන් සහිතව දක්වන්න. (ල 3)

iii.

a) ජෛව ගෝලයේ සීමාවන් පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ලියා දක්වන්න. (ල 2)

A- ශිලා ගෝලය

B- ජල ගෝලය

b) ජෛව ගෝලයේ සමතුලිතතාව බිඳ වැටීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න. (ල 3)

03)


i. මානුෂ හා ස්වභාවික ක්‍රියාවලීන් මගින් බහුල ලෙස වායුගෝලයට එක්වන අහිතකර වායු වර්ග දෙකක් නම් කරන්න. (ල 2)

ii. පරිවර්තී ගෝලයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල 3)

iii. වායු දූෂණය අවමකර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ල 5)

04)

i. යාබද රූප සටහනේ දක්වෙන්නේ පෘථිවියේ ආදර්ශ ගෝලයයි. එහි A, B වලින් දක්වා ඇති දේශගුණික කලාප නම් කරන්න. (ල 2)




ii. ඔබ නම් කළ එක් දේශගුණික කලාපයක ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල 3)

iii.

a) දේශගුණ වර්ග තීරණය කිරීම කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (ල 2)

b) දේශගුණය මිනිස් කටයුතු කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල 3)

05)

i. ලෝකයේ ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ දෙකක් ලියා දක්වන්න. (ල 2)

ii. වී වගාව කෙරෙහි බලපාන භෞතික සාධක තුනක් ලියන්න. (ල 3)

iii. කරුණු තුනක් ඇසුරෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වී වගාවේ ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල 5)

06)

i. පෘථිවියෙහි ව්‍යාප්ත වී ඇති ස්වභාවය අනුව ජලයෙහි ආකාර දෙකක් සඳහන් කරන්න. (ල 2)

ii. ජලයේ ගුණාත්මකබව අඩු වීමට බලපා ඇති මිනිස් ක්‍රියාකාරකම් තුනක් ලියන්න. (ල 3)

iii. ජල චක්‍රය රූප සටහනක් ඇසුරින් වස්තර කරන්න. (ල 5)

07)

i. ලෝකයේ ප්‍රධාන වශයෙන් තිරිඟු වගා කරන ආසියාතික රටවල් දෙකක් නම් කරන්න. (ල 2)

ii. තිරිඟු වගාවේ දියුණුවට බලපා ඇති භෞතික සාධක දෙකක් හා මානුෂ සාධක එකක් සඳහන් කරන්න. (ල 3)

iii. තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ල 5)

08)

i. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ප්‍රධාන කොටස් දෙකක් නම් කරන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ වැදගත්කම පිළිබඳ කරුණු තුනක් දක්වන්න. (ල 3)

iii. මෙරට ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් මුහුණ දෙන ගැටළු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල 5)